රාහුල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය - කොළඹ ශාඛාවේ නිල ප්‍රකාශනය

# රාහුල
# RAHULA

සිවු මාසිකය - 2018 අප්‍රේල් - 2018 ජූලි



# 56 වන මහා සභා රැස්වීම














රාහුල විද්‍යාලයීය කොළඹ ආදි ශිෂ්‍ය සංගමයේ 56 වන මහා සභා රැස්වීම 2018 මාර්තු මස 24 වන දින ඇතුල් කෝට්ටේ වෙත්තසිංහ ශාලාවේදී පැවැත්වූ අතර එහිදී 2018/2019 වසර සඳහා නව නිලධාරී මණ්ඩලය පත්කර ගැනීම සිදුවිය.

එහි ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යංශයේ අතිරේක ලේකම් මාධව දේවසුරේන්ද්‍ර මහතා සහභාගී වූ අතර එදින විශේෂ ආරාධිත අමුත්තා වශයෙන් ජ්‍යෙෂ්ඨ වෛද්‍ය ප්‍රියන්ත ජගත් වීරරත්න මහතා සහභාගී විය.

එහිදී 55 වන වාර්ෂික සභා රැස්වීම් වාර්තාව ලේකම් නීතිඥ ශිරාල් ලක්තිලක මහතා විසින් සභාගත කරන ලද අතර වාර්ෂික ගිණුම් වාර්තාව භාණ්ඩාගාරික ඩී පී වික්‍රමසිංහ මහතා විසින් ඉදිරිපත් කරන ලදී.

මේ අතර සාමාජික ගාස්තු සංශෝධනයක් ද සිදුවිය. එහිදී යාවජීව සාමාජික ගාස්තුව රුපියල් 5,000 දක්වා වැඩි කරන ලදී.

එහිදී හිටපු ලේකම් නීතිඥ ශිරාල් ලක්තිලක මහතා විසින් සිදුකළ සේවය ඇගයීම වෙනුවෙන් විශේෂ උපහාරයක් පිරිනැමීම සිදුවිය.

2018/2019 වසර සඳහා නව නිලධාරී මණ්ඩලය වශයෙන් සභාපති රියර් අද්මිරාල් සරත් මොහොට්ටි, ලේකම් ඩී පී වික්‍රමසිංහ , භාණ්ඩාගාරික ගාමිණී ජයදේව යන මහත්වරුන්ද, උප සභාපතිවරුන් ලෙස ආචාර්ය සුජීව ලොකුහේවා, ඉන්දික ගුණවර්ධන සහ සුනිල් ගමගේ යන මහත්වරුන් ද, උප ලේකම්වරුන් වශයෙන් ජේ ඒ වික්‍රමසිංහ සහ ඩී පී වෙත්තසිංහ යන මහත්වරුන් ද, උප භාණ්ඩාගාරික ලෙස නීතිඥ දිනේශ් විදානපතිරණ මහතා ද , ප්‍රධාන සංවිධායක ලෙස ටී ජේ ජයරත්න මහතා ද, ක්‍රීඩා ලේකම් ලෙස රොහාන් සෝමවංශ මහතා ද, සුබසාධක ලේකම් ලෙස චන්දන ගමගේ මහතා ද, ආගමික සහ සංස්කෘතික ලේකම් ලෙස එස් එන් පල්ලියගුරු මහතා ද, නීති ලේකම් ලෙස නීතිඥ ජානක අමරසිංහ මහතා ද, මාධ්‍ය ලේකම් ලෙස ශ්‍රීපාල් වන්නිආරච්චි මහතා ද, සංස්කාරක ලෙස විසිත්ත රංගන මහතා ද, අභ්‍යන්තර විගණකවරුන් ලෙස රංජිත් වීරසිංහ මහතා සහ නුදිත රණවක මහතා ද, උප අනුශාසකවරු වශයෙන් ඩී ඊ ඩබ්ලිව් ගුණසේකර, වෛද්‍ය සංජය සේදර සෙනරත්, අනුජ කාමන් වික්‍රමසිංහ, ජනාධිපති නීතිඥ කුසුම්සිරි බාලපටබැඳි, ආරිය රූබසිංහ සහ ටී සුරවීර යන මහත්වරුන් ද පත්කරන ලදී.

තවද, විධායක කමිටු සාමාජිකයින් වශයෙන් අමරා නානායක්කාර මහත්මිය, නීතිඥ ශිරාල් ලක්තිලක, ආචාර්ය එන් එස් කුමානායක, මේජර් රංජිත් කුමාර බැට්ටගේ, ජයන්ත කුමාර ඩයස්, නීතිඥ කමලනාත් දිසානායක, යූ ඩී සී දිලුම්ප්‍රිය, සී ඒ ජගත්චන්ද්‍ර, සුජීව ජයවර්ධන, කර්නල් කීර්ති කෝට්ටවත්ත, අනුර නන්දදේව, කේ ඩබ්ලිව් රවිකීර්ති, කලණ අල්විස්, ජගත් සමරසිංහ, ඩී. ඩබ්ලිව්. කීර්ති සිල්වා, අයි එච් උබේවංශ, තිලක් වීරසූරිය, කීර්ති දිසානායක, ආනන්ද ගමගේ, ප්‍රියන්ත සේනාධීර, නීතිඥ ප්‍රියල් විජේවීර, එච් ජී සරත්චන්ද්‍ර, අශ්හර් හමීම්, ඒ. බී. ගැමුණු ද සිල්වා, ජගත් ජයවර්ධන, මුදිත අමරසිංහ, රේණුක විජේසිංහ, රුවන් ලියනගමගේ, වයි කේ කුලරත්න, එස් එම් මරික්කාර්, වෛදය ලාල් ඒකනායක, රුවන් විජේසිරිවර්ධන, අයි එස් කේ අබේවික්‍රම, චන්දන මුහන්දිරම්, එච් සී ජයවීර, ඒ බී අනුර ද සිල්වා කිත්සිරි දිසානායක, අජිත් ශාන්ත කුමාර, ආචාර්ය ලෝචන්දක රණතුංග සහ ගයාන් ලක්ෂිත රණවක යන මහත්වරුන් ද රාහුල ශිෂත්ව භාරයේ ලේකම් ලෙස නන්දසේන බඹරවානගේ මහතා ද පත්කර ගන්නා ලදී.

# ජීවිතයට ජීවය දුන් ආදී රාහුල පුත්‍රයන්

රාහුල විද්‍යාලයීය කොළඹ ආදී සිසුන්ගේ තවත් සමාජ මෙහෙවරක් ලෙස වාර්ෂික ලේ දන්දීමේ වැඩසටහන ජුනි මස 27 වෙනි දින මාලඹේ පිරිමි ආදර්ශ විද්‍යාලයේදී පැවැත්විණි.

නොකඩවා 11 වැනි වරටත් සංවිධානය කළ මෙම ලේ දන්දීමේ වැඩසටහන පසුගිය පොසොන් පොහෝදින එම සංගමයේ සාමාජිකයින් ඇතුළුව ප්‍රදේශ වාසීන් බොහෝ දෙනෙකුගේ සහභාගිත්වයෙන් ඉතා සාර්ථකව පවත්වන ලදී.
මහරගම අපේක්ෂා රෝහලේ නේවාසික රෝගීන් සඳහා අවශ්‍ය ලේ ලබාදීම් වෙනුවෙන් මෙම මාහැඟි පුණ්‍ය කර්මය රාහුල විද්‍යාලයීය කොළඹ ආදි ශිෂ්‍ය සංගමයේ ආගමික හා සංස්කෘතික කමිටුව මගින් සංවිධානය කරන ලදී.

2008 වර්ෂයේදී ආරම්භ කළ මෙම වැඩසටහන නොකඩවා වර්ෂ 11ක් පැවැත්වීමට ලැබීම පිළිබඳව ඉමහත් සතුටට පත්වන බවත් මෙම සමාජ සත්කාරය ඉදිරියේදීත් නොකඩවා පවත්වා ගෙන යාම සංගමයේ අරමුණ බවත් කමිටුවේ වත්මන් සභාපති එස් එන්. පල්ලියගුරු මහතා පැවසීය .

මේ සඳහා තව දුරටත් කරුණු දැක්වූ පල්ලියගුරු මහතා පවසා සිටියේ මෙම භාරදූර කාර්ය සාර්ථකව ඉටුකර ගැනීම සඳහා රාහුල කොළඹ ආදි ශිෂ්‍ය සංගමයේ වත්මන් සභාපති තුමන්, ලේකම් තුමන් ඇතුළු සියළුම සාමාජිකයන්ගෙන් උපරිම සහයෝගය ලද බවත් එය මෙම වැඩසටහන සාර්ථකත්වයට ඉමහත් ශක්තියක් වූ බවත් පැවසීය .

සියළු දානයන්ගෙන් උත්තම දානය ජීවිත දානය බවත් ඒ වෙනුවෙන් තම ලේ දන්දුන් එම උත්තම පරිත්‍යාගශීලීන්ට සංගමය වෙනුවෙන් හද පිරි ස්තුතිය පිරිනමන අතර ඔවුනට සසර වසන තෙක්ම නිරෝගී සුවය ප්‍රාර්ථනා කරන බව පැවසිය.







මේ සම්බන්ධයෙන් කරුණු දැක්වූ එම කමිටුවේ ලේකම් ජේ. ඒ. වික්‍රමසිංහ මහතා අදහස් දක්වමින් පවසා සිටියේ මෙම දානමය පුණ්‍යකර්මය සඳහා පරිත්‍යාගශීලීන් 122 දෙනෙකු ලේ දන්දුන් බවත් එම කාර්ය සඳහා සම්බන්ධ වූ මහරගම අපේක්ෂා රෝහලේ අධ්‍යක්ෂ තුමන්, ලේ බැංකුවේ අධිකාරි තුමන්, සියලුම වෛද්‍යවරුන්, හෙද නිලධාරි වරුන් සහ සෙසු කාර්ය මණ්ඩලයටත් නන් අයුරින් සහයෝගය දැක්වූ සියලු දෙනාටත් ආදි ශිෂ්‍ය සංගමයේ ගෞරවයත් ආශීර්වාදයත් පිරිනමන බවයි.

## රාහුල කෞතුකාගාරය





ජනාධිපති කාර්යාලයේ Mother ශ්‍රී ලංකා වැඩසටහන යටතේ RUN පාසැල් සමාජ පිහිටුවා R- Responsible Citizenship සහ National Pride යන තේමාවන් ඔස්සේ 2011 දී රාහුල කෞතුකාගාරය පිහිටුවන ලදී.
Bronze Award එකක් හිමිකරගත් මෙම ව්‍යාපෘතිය තුළින් රාහුල විදුහලට ප්‍රයෝජනවත් තම ප්‍රෞඪ ඉතිහාසය විදහා දැක්වීමට ආදී ශිෂ්‍යයන්ට වත්මන් සේම අනාගත රාහුලයන්ටද මහත් වටිනාකමක් වනු ඇත. පාසල් නිර්මාතෘවරුන්, ආදී විදුහල්පති වරුන් පිළිබඳ විස්තර , වටිනා පැරණි රාහුල සඟරා, ආදි ශිෂ්‍යයන් පිළිබඳ තොරතුරු, පාසැල ලැබූ ජයග්‍රහණ මේවා අතර වෙයි. 1975 ට පෙර අතීත විස්තර වැඩිපුර මෙහි විදහා දක්වා ඇත.

රාහුල හිටපු ගුරුභවතකු වන නන්දසිරි මුතුකුමාරණ මහතා විසින් කෞතුකාගාරයට විරල වූ සඟරා, ඡායාරූප , විස්තර ලබාදීම මෙහිදී කෘතවේදීව සිහිකළ යුතුයි.
නන්දසේන බඹරවානගේ මහතා විසින් මෙහි නවීකරණයට සහ පැවැත්ම ආරක්ෂාකර දීමට අරමුදලක් පිහිටුවීමටද යෝජනාකර ඇත. මෙය සංරක්ෂණය කිරීම අතවශ්‍ය කටයුත්තක්ව ඇත.

මාතරට එන විදේශගත රාහුල ආදි ශිෂ්‍යයන්, පිට පෙදෙස්වල වෙසෙන අය කෞතුකාගාරය නැරඹීමට කෙසේ හෝ පැමිණීමට උත්සුක වෙයි. ආදි ශිෂ්‍යයන් වන නන්දසිරි මුතුකුමාරණ. ගුණපාල වික්‍රමරත්න, ගාමිණී ජයසේකර, වෛද්‍ය උපුල් විජේවර්ධන, වැනි කීර්තිමත් අදි ශිෂ්‍යයන් සහ වත්මන් රජයේ ඉහල තනතුරු දරණ ශිරාල් ලක්තිලක, එච්. එන්. විජේරත්න, ඩී. විජේසූරිය වැනි අයද මෙහි අගය දැකීමට පැමිණි අය වෙයි.

කෞතුකාගාරය භාර පුෂ්පරාණි හෙට්ටිආරච්චි ගුරුතුමිය විසින් ආදි ශිෂ්‍යයන් ළඟ වටිනා ඉතිහාසගත දේ ඇත්නම් කෞතුකාගාරය වෙත ලබදෙනමෙන් ඉල්ලා සිටියි.

# රාහුල ආදි සිසුන් දෙදෙනෙක් විශිෂ්ට සේවා විභූෂණය සම්මානයෙන් පිදුම් ලබයි



අවම වශයෙන් වසර විසි පහක අඛණ්ඩ සේවයක් සහ නිර්මල පෞද්ගලික හා සෛනික පැවැත්මක් සතුව තිබෙන, සුවිශේෂ වූද උදාර වූද, අවනත වූද, සේවය අරභයා උපහාර වශයෙන්, යුධ හමුදාවේ, නාවික හමුදාවේ සහ ගුවන් හමුදාවේ නිත්‍ය බලසේනාවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙත පිරිනමන විශිෂ්ට සේවා විභූෂණය පළඳනාව රාහුල විද්‍යාලයීය කොළඹ ආදි ශිෂ්‍ය සංගමයේ වර්තමාන සභාපති රියර් අද්මිරාල් සරත් මොහොට්ටි සහ මේජර් ජෙනරාල් ජගත් පක්ෂවීර යන රාහුල ආදි සිසුන් වෙත 2018 මැයි මස 19 වනදා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති හා සේනාධිනායක මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා අතින් පිරිනමනු ලැබීය .

වසර 35 ක් මුළුල්ලේ නොකැලැල් පෞද්ගලික පැවැත්මකින් යුක්තව ශ්‍රී ලංකා නාවික හමුදාව වෙනුවෙන් ඉටුකරන ලද සුවිශේෂී සහ අවනත සේවයට උපහාරයක් වශයෙන් රියර් අද්මිරාල් සරත් මොහොට්ටි මහතාට සහ වසර 35 ක් මුළුල්ලේ නොකැලැල් පෞද්ගලික පැවැත්මකින් යුක්තව ශ්‍රී ලංකා යුධ හමුදාව වෙනුවෙන් ඉටුකරන ලද සුවිශේෂී සහ අවනත සේවයට උපහාරයක් වශයෙන් මේජර් ජෙනරාල් ජගත් පක්ෂවීර මහතාට මේ පළඳනාව පිරිනමනු ලැබීය .

මෙම පළඳනාව සඳහා නිර්දේශ කිරීමේදී අවශ්‍ය චරිත තත්ත්වය තීරණය කිරීමද, පළඳනාව ලැබීමට සෑම අයුරකින් ම සුදුසු වූත්, ස්වකීය මුළු සේවා කාලය තුලදී සර්වප්‍රකාරයෙන් ම අදූෂ්‍යව පැවති චරිතයක් ඇත්තා වූත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පමණක් සුදුසුකම් ලබන අතර මෙම විශිෂ්ට සේවා විභූෂණය සුවිශේෂී ප්‍රදානයක් වන අතර, එය හුදෙක් යුධ හමුදාවේ ජ්‍යෙෂ්ඨතම සහ ඉහල නිළ වල නිලධාරීන් වෙත සහ නාවික හා ගුවන් හමුදාවල ඒ හා සමාන නිළ දරන නිලධාරීන් වෙත පමණක් පදානය කරනු ලැබේ.



**විශිෂ්ට සේවා විභූෂණය පළඳනාව රාහුල විද්‍යාලයීය කොළඹ ආදි ශිෂ්‍ය සංගමයේ වර්තමාන සභාපති රියර් අද්මිරාල් සරත් මොහොට්ටි වෙත ජනාධිපති හා සේනාධිනායක මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා අතින් පිරිනමමින්**



**විශිෂ්ට සේවා විභූෂණය පළඳනාව රාහුල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය මේජර් ජෙනරාල් ජගත් පක්ෂවීර වෙත ජනාධිපති හා සේනාධිනායක මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා අතින් පිරිනමමින්**

රාහුල විද්‍යාලයීය කොළඹ ආදි ශිෂ්‍ය සංගමය මගින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන රාහුල සැඳෑව 2018 මාර්තු 3 වන දින බත්තරමුල්ල Waters Edge හිදී මහත් උත්සවශ්‍රීයෙන් පැවැත්විණි. එයට රාහුල විද්‍යාලයේ ආදී ශිෂ්‍යයන් විශාල ප්‍රමාණයක් සහභාගී වූ අතර උත්සවය ලංකාවේ ජනප්‍රිය සංගීත කණ්ඩායමක් වන සන්ෆලවර් සංගීතයෙන් රසවත් විය. එය නර්තන අංග සහ ගැයුම් වලින් සමන්විත විය. එහි ප්‍රධාන ආරාධිත අමුත්තන් වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතා සහ ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ ඩබ්ලිව් ඒ රන්දෙණිය මහතා සහභාගී විය.

# RAHULA සැඳෑව 2018

## The Get-together & Dinner Dance



















# ආදී ශිෂ්‍ය ක්‍රීඩා සමාජයේ මෙහෙයවීමෙන් 'RHYTHM OF THE NIGHT' Sing Along with ඇනෙස්ලි මාලේවන

රාහුල විද්‍යාලීය කොළඹ ආදිශිෂ්‍ය සංගමයේ ක්‍රීඩා සමාජය විසින් ක්‍රීඩා අරමුදල් තර කිරීම සඳහා සංවිධානය කළ " Sing Along with ඇනෙස්ලි මාලේවන " හෘදයාංගම සංගීත ප්‍රයාමය පසුගිය ජුනි 30 වෙනිදා තලවතුගොඩ ග්‍රෑන්ඩ් මොනාක් උත්සව ශාලාවේදී අති උත්කර්ෂවත් අයුරින් පැවැත්විණි.

ක්‍රීඩා සමාජය විසින් පළමු වරට සංවිධානය කළ මෙම සංගීත සැඳෑව ආදී ශිෂ්‍යයින්, ඔවුන් ගේ පවුල් වල සාමාජිකයින් සහ සංගීතයට ආදරය කරන බොහෝ බාහිර පිරිස් සහභාගී විය.

මෙම සුන්දර අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස විද්‍යාලයීය වර්තමාන විදුහල්පති ෆ්‍රැන්සිස් වෙලේගේ මහතා සහභාගී වූ අතර විශේෂ ආරධිකයන් ලෙස සංගමයේ සභාපති රියර් අද්මිරාල් සරත් මොහොට්ටි මහතා සහ ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුවේ සභාපති ආචාර්ය සුජීව ලොකුහේවා මහතා සහභාගි විය.

සන්ද්‍යාවේ 7.00 ට ආරම්භ කළ සංගීත පිළිසඳර රාත්‍රී 11.00 ට අවසන් වීමට නියමිතව තිබිණි. එහෙත් ප්‍රේක්ෂකයන්ගේ දැඩි ඉල්ලීම සහ පැවති මිහිරියාව හේතුවෙන් එය රාත්‍රී 12.30 දක්වා පැවැත්විය.

ජනප්‍රිය කණ්ඩායම් සංගීතයෙහි අතිශයින් ජනප්‍රිය ගායකයකු වූ ඇනෙස්ලි මාලේවන ප්‍රධාන සංගීත ශිල්පියා ලෙස සහභාගීවූ අතර සුපර් චයිම්ස් සංගීත කණ්ඩායම වාදනයෙන් සහය විය.

මෙම රිදම් නයිට් සංගීත වැඩ සටහනේ මුඛ්‍ය පරමාර්ථය වූයේ රාහුල විද්‍යාලයීය කොළඹ ආදී ශිෂ්‍ය සංගමයේ ක්‍රීඩා සමාජයේ අරමුදල් තර කිරීම සඳහා බව ක්‍රීඩා සමාජයේ සභාපති රොහාන් සෝමවංශ මහතා පැවසිය. තව දුරටත් කරුණු දැක්වූ ඔහු පවසා සිටියේ විද්‍යාලයේ ශිෂ්‍යයන්ට අත හිත දීමත් ක්‍රීඩා භාණ්ඩ ලබා දීමත් ආදී ශිෂ්‍ය සංගමය වාර්ෂිකව සංවිධානය කරන සාමාජික ක්‍රීඩා උත්සවය පැවැත්වීමත් මෙහි පරමාර්ථය බවත්ය.

ඉතා හෘදයාංගම රටාවකින් පැවති මෙම සංගීතමය වැඩ සටහන සහභාගී වූ බොහෝ සංගීත ලෝලීන්ට නැවුම් අත්දැකීමක් විය. සාම්ප්‍රදායික ආරෙන් මිදුණු මෙම හොරා කිහිපය ලයාන්විත ආකාරයකින් සහ උද්යෝගයකින් පිරුණු අවස්ථාවක් විය. ගායකයන් සහ සංගීත කණ්ඩායම වේදිකාව මත ගයනවිට ප්‍රේක්ෂකයන් වේදිකාවෙන් බැහැරව එදෙස බලා සිටීමේ ගතානුගතික සම්ප්‍රධාය බිඳ දමමින් ගායක ඇනෙස්ලි ප්‍රේක්ෂකයන් අතර සිට එකට ගයද්දී මුළු ශාලාවම එකම වේදිකාවක් බවට පත්විය. Sing Along with ඇනෙස්ලි මාලේවන යන තේමාව සැබෑ යථාර්තයක් බවට පත් කරමින් ප්‍රේක්ෂකයන් සියලු දෙනාම එක්ව ගයමින් මිහිරි අත්දැකීමක් ලද බව සහභාගී වූ බොහෝ දෙනෙක් පැවසිය.

වැඩ සටහන් පෙළ ගැස්වීමේදී සංවිධායකයින් විසින් තවත් අංග කිහිපයක් එක් කොට තිබීණි. මෙහි දෙවන විවේකයේදී සහභාගී වූ ප්‍රේක්ෂකයන් සතු අවසර පත්‍ර සඳහා කුසපත් ඇදීමෙන් ජයග්‍රාහකයින් තිදෙනෙකු තොර ගැණුනි . පළමු, දෙවන සහ තුන්වන ජයග්‍රාහකයින්ට ත්‍යාග පිරිනැමීට රාහුල විද්‍යාලයේ වර්තමාන විදුහල්පති ෆ්‍රැන්සිස් වෙලේගේ මැතිතුමන් සහ ආදී ශිෂ්‍ය සංගමයේ සභාපති රියර් අද්මිරාල් සරත් මොහොට්ටි මහතා සහ ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුවේ සභාපති ආචාර්ය සුජීව ලොකුහේවා මහතා අතින් සිදුවිය. මෙහිදී විශේෂ කරුණක් වූයේ ප්‍රථම ත්‍යාගය හිමිකරගත් වාසනාවන්තයා වූයේ කොළඹ ආනන්ද විද්‍යාලයෙන් මෙම අවස්ථාවට සහභාගිවූ සහෘදයෙකි. මෙයට අමතරව ප්‍රේක්ෂකයන් අතුරින් ලබාගත් Business Card අතුරින්ද ජයග්‍රහයකු තෝරා ත්‍යාග පිරිනමන ලදී.

ක්‍රීඩා සමාජයේ ලේකම් ප්‍රභාත් වෙත්තසිංහ මහතා මේ සම්බන්ධව පැහැදිලි කරමින් පවසා සිටියේ මෙම අරමුදල මගින් පාසැලේ ක්‍රීඩකයන්ට අතහිත දීමත් පාසලට ක්‍රීඩා භාණ්ඩ ලබා දීමත් සහ පාසැල වෙනුවෙන් ක්‍රීඩා කරන සහ වැඩමුළු සඳහා සහභාගීවන පාසලේ ශිෂ්‍යයන්ට මූල්‍ය පහසුකම් ලබාදෙන බවත් ය.












# කතිකාවත

## හිටපු විදුහල්පති
# එන් .ආරියවංශ මහතා සමග
## “මගේ කාලයේ දේශපාලඥයන්ට මම හිස නැමුවේ නැහැ”



**මාතර රාහුල විද්‍යාලයේ තවත් සුවිශේෂී අවධියක් ලෙස හ ආරියවංශ යුගය හැඳින්විය හැකියි. දකුණු පළාත තුල පැතිර ගිය තරුණ විප්ලවකාරී තත්වයේ අවසන් භාගයේ මාතර රාහුල විද්‍යාලයේ විදුහල්පති ලෙස වැඩ බාර ගැනීමම එන් ආරියවංශ මහතා ගේ තවත් සුවිශේෂී තත්ත්වයක්. එතැන් සිට විද්‍යාලය ගොඩ නැගීම අභියෝගයක් ලෙස බාරගත් ඔහු එම ඉලක්ක සපුරා ගත්තේ ද? මේ, මාතර රාහුල විද්‍යාලයේ හිටපු විදුහල්පති හ ආරියවංශ මහතා සමග ඒ පිළිබඳව කළ කතිකාවයි.**

**ප්‍රශ්නය : ඔබ රාහුලයේ තනතුර භාරගන්නේ අභියෝගාත්මක කාල පරිච්චේදයකදී. ඇයි ඒ වගේ අභියෝගයක් බාරගන්න හිතුවේ?**

පිළිතුර : මමත් රාහුලයේ ආදී ශිෂ්‍යයෙක්. මගේ අයියත් රාහුලයේ. මගේ මල්ලිත් රාහුලයේ හිටියේ. මම මුලින්ම අකුරැස්ස මාරඹ පිරිමි පාසලේ ඉගෙනුම ලැබුවා. දෙනියාය මධ්‍ය මහා විද්‍යාලයට ගියා. පසුව මොරටුව සෙබෙස්තියන් විදුහලටත් ගිහිල්ලා අවසානයේදී මාතර රාහුල විදුහලට ආවා. 1990 ඉඳලා 1998 දක්වා ආරියවංශ යුගය. මං මුලින්ම කියන්නම් මේ අභියෝගය බාරගත්තේ ඇයි කියලා මට ඒ අවස්ථාවේදී විකල්ප කිහිපයක් තිබුනා. දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විදියටත් බාරගන්න තිබුනා. ඒ කාලයේ රටේ අයහපත් කලබලකාරී තරුණ අසහනයක් තිබුණ කාලයක්. ඒක රාහුලයට දැඩිව බලපාල තිබුනා. කිසි කෙනෙක් රාහුලයට එන්න කැමති වුනේ නෑ . මම ඒක බාරගත්තා.

**ප්‍රශ්නය : ඒ අභියෝගය ජයගන්න ඔබ කරපු විශ්මිත දේවල් මොනවාද ?**

පිළිතුර : මම මුලින්ම පාසලට ගිහිල්ලා පාසලේ භෞතික සම්පත් ප්‍රමාණවත් ද කියල සොයා බැලුවා. ජුබිලි ශාලාව හොඳටම අබලන්. ගොඩනැගිලි වල දූවිලි පිරිලා. මේස කකුල් කැඩිලා. ඉතිං මේ තත්ත්වය හොඳට අවබෝධ කරගත් මම මානව හා භෞතික සම්පත් සංවර්ධනයට හොඳ සැලැස්මක් හැදුවා. මම අධ්‍යාපන අමාත්‍යංශයට ඒ සැලැස්ම ඉදිරිපත් කළා. වසරකට රුපියල් ලක්ෂ 100 ක් මම ඉල්ලුවා.

**ප්‍රශ්නය : වියදම් කළ මුදලින් පාසලට කළ දේ මොනවාද ?**

පිළිතුර : එකළ සුදර්ශන ආදර්ශ විද්‍යාලයේ එක් කොටසක් , ප්‍රාථමික අංශය ලෙස 1991 වසරේ දී රාහුල විද්‍යාලයට එක් වුනා.

පාසලට අළුත් සංකල්පයක් හඳුන්වා දුන්නා. ඒ තමයි විමර්ශණ පුස්තකාලය, රුපියල් එක්කෝටි හතලිස් ලක්ෂයක් පමණ ඒ සඳහා වැය බරක් දරලා දරුවන්ට දැනුම වර්ධනය කරගන්න වටිනා පොත් පත් වලින් සමන්විත එකක් බවට පත් කළා. වනිගසේකර ගොඩනැගිල්ලේ ඉහල මාලයේ ඒ පුස්තකාලය පවත්වාගෙන ගියා.

මම ඒ පුස්තකාලය පවත්වාගෙන යාමේ වගකීම භාර දුන්නේ ලෆීර් ගුරුතුමාට. ඒකත් එක්තරා රසවත් කතාවක්. ලෆීර් මහත්තයා තෝරගත්ත විදිය. ඒක ප්‍රසිද්ධියේ කියන්න මම කැමති නැහැ. කොහොම වුනත් භාර දීපු වගකීම ඒ මහත්මයා හොඳටම කළා.

මම පාසැල පාලනය කරපු කාල පරිච්ඡේදය තුලදී රුපියල් ලක්ෂ 690 ක විතර ගොඩනැගිලි ලබා දුන්නා කියලා අධ්‍යාපන අමාත්‍යාංශයට කියලා තිබුණා ඒ කාලේ .

**ප්‍රශ්නය : මානව සම්පත් සංවර්ධනය කළ වෙනත් දේ මොනවාද ?**

පිළිතුර : හ්ම්.. මගේ කාලේදී මම පාසැලේ දරුවන්ගේ ගුණාත්මක බව වර්ධනය කරන්නත්, මනස දියුණු කරන්නත් භාවනා වැඩ සටහන් හඳුන්වා දුන්නා. දෛනිකව මල් පූජාවක් කලා. ඒකෙන් අපේ දරුවෝ ආගම දහමටත් ලැදි වුනා. ඒ කාල වකවානුව තරුණ විප්ලව අදහස් ඔළුවෙන් ඈත් වෙලා තිබුණු කාලයකුත් නොවේ. මොකද මම භීෂණය කියන වචනය පාවිච්චි කරන්න කැමති නැහැ. ඒ කාලේ විප්ලවකාරී තරුණ අවධියක් පසු කරමින් තිබුණු කාලයක් කියන්න කැමතියි. අපේ දරුවෝ මල් පූජාවට දවස් ගණන් ගුරුවරුත් සමග එක්වුනා.භාවනා කළා. උසස් පෙළ දරුවෝ හොඳ තැනකට ලඟා වුනා.අධ්‍යාපන කටයුතු වලට වැඩි වැඩියෙන් යොමුවෙන්න ගත්තා.

**ප්‍රශ්නය : ඒකෙ ප්‍රතිඵල ලැබුනද ?**

පිළිතුර : ඔව් ඇයි නැත්තේ. අපේ දරුවෝ ඉහළ ප්‍රතිඵල ගත්තා.

මුළු දිවයිනේම පළමු, දෙවන, තුන්වන තැන්වලට ආවා. මම එන්න කලින් වෛද්‍ය විද්‍යාලයට මාතර දිස්ත්‍රික්කයේ ළමයි 20 ක් වගේ තමයි සුදුසුකම් ලබලා තිබුනේ. අපේ මහන්සියෙන්, අධ්‍යාපන සංවර්ධන වැඩ පිළිවෙල තුලින් රාහුලයේ ඉහල තලයකට ගෙන්න, වැඩි සිසුන් පිරිසක් වෛද්‍ය විද්‍යාලයට යවගන්නත් පුළුවන් වීම ඒ කාලේ ආචාර්ය මණ්ඩලයේ ජයග්‍රහණයක් කිවොත් නිවැරදියි. දැනුම සොයා යන දරුවෙකුට ඕන ඉන්ටර්නෙට් පහසුකම් පවා ලබා දෙමින් 1995/1996 වසර ඉහලම ප්‍රතිඵල ගෙන දෙන විද්‍යාලයක් බවට එදා පත් වුනා. ඒ සඳහා ගුරුවරුන්ටත් අවශ්‍ය නිසි මාර්ගෝපදේශ දුන්නා, ආයාසයකින් තොරව ගුරුවරුන්ටත් විධිමත් පුහුණුවක් දෙන්න කටයුතු කළා.

**ප්‍රශ්නය : ඔබ යුගයේදී පාසැලේ ගුණතිලක ශාලාව නාට්‍ය වැනි විශේෂ අවස්ථා සඳහා ලබාදීම නතර කිරීමට පියවර ගත්තා. ඒක අභියෝගාත්මක තීන්දුවක් නේ ද ?**

පිළිතුර : මම කිව්වා වගේම කවුරුවත් නොකළ නොහිතපු අභියෝගාත්මක තීරණයක් ගන්න මට සිද්ධ වුනා. ඒ තීරණය ගන්න හේතු වුනේ පාසැලේ භෞතීය සම්පත් විනාශ වන්න ඉඩ නොදී රැක ගැනීම විදුහල්පති විදියට මට පැවරිලා තිබුණු කාර්යක් නිසා. සෑම සති අන්තයකදිම ගුණතිලක ශාලාව, වේදිකා නාට්‍ය වලට ලබාදුන්නා. ඒ අවස්ථාවේදී පිටතින් පැමිණෙන පුද්ගලයන් ගොඩනැගිල්ලට හානි කරලා තිබුනා. බිත්ති සූරලා, බිත්ති වල විවිධ දේ ලියලා , වීදුරු කඩලා ඒවගේ කටයුතු කරලා තිබුනා. මම මේක හොඳින් නිරීක්ෂණය කළා. පිටතින් පැමිණෙන සමහර තරුණ තරුණියන් විද්‍යාලයේ ඇතැම් ගොඩනැගිලිවල අශෝභන ලෙස හැසිරෙන ආකාරය මගේ ඇස් දෙකෙන්ම මම දැක්කා. ඒ මම හදිසි සොයාබැලීම් කරපු නිසා. මට පාසලේ ගරුත්වයයි, ගොඩනැගිලි වල ආරක්ෂාවයි වෙනුවෙන් ගත හැකි තීන්දුව මම අරගෙන ගුණතිලක ශාලාව බාහිර කටයුතු වලට දීම තහනම් කළා.

**ප්‍රශ්නය : එල්ල වුනු අභියෝග මොනවාද ?**

පිළිතුර : අභියෝග එමටයි. ප්‍රාදේශීය දේශපාලඥයන්ගේ සිට ඇතැම් ජාතික දේශපාලනයේ නිරත පිරිස් මට බලපෑම් කළා. මගෙන් ප්‍රශ්න කළා. අවසානයේදී එවකට හිටපු ජනාධිපතිතුමා දක්වා මේ ප්‍රශ්නය දුරදිග ගොසින් තිබුනා. මගෙන් අධ්‍යාපන අමාත්‍යංශය ප්‍රශ්න කළා. මම සාධක පෙන්වලා දුන්නා. ඒත් අද කණගාටුයි.

**ප්‍රශ්නය : ඇයි එහෙම කියන්නේ ?**

පිළිතුර : රාහුල විද්‍යාලයේ අනන්‍යතාව තිබුනේ ගුණතිලක ශාලාවේ, අද ඒක කඩා බිඳ දාලා. අලුත්වැඩියා කරනවා, තාම අවසානයක් දකින්න නැහැ. රාහුලේ අනන්‍යතාව දකින්න නැහැ. විශ්‍රාමික ගුරු සංගමය විදියට ලිපියක් පවා යොමු කළා. ඒත් වැඩක් වුනේ නැහැ. ගුණතිලක ශාලාව කඩා දැම්මා. ඒ ගැන දිගින් දිගටම විමසන විට කිව්වේ ඉහළින් ආපු නියෝග කියලා. ඒත් මම හිටියානම් ඒක කරන්න දෙන්නේ නැහැ.

**6 වෙනි පිටුවට**

# රාහුල සහ ධර්මපාල වාර්ෂික මහා ක්‍රිකට් තරගයේ පළමු ඉනිමේ ජය රාහුලට

මාතර රාහුල විද්‍යාලය සහ පන්නිපිටිය ධර්මපාල විද්‍යාලය අතර වාර්ෂිකව පැවැත්වෙන මහා ක්‍රිකට් තරගාවලිය මෙවර මාතර උයන්වත්ත ක්‍රීඩාංගනයේදී පැවැත්විණ. මෙය පාසැල් දෙක අතර පැවැත්වෙන මහා ක්‍රිකට් තරගාවලියේ 7 වන තරගයයි.

දෙදින තරගාවලියක් වන මහා ක්‍රිකට් තරගය ජය පරාජයකින් තොරව නිමාවූ අතර එහි පළමු ඉනිමේ ජය රාහුල විද්‍යාලය හිමිකර ගන්නා ලදී.

පළමු ඉනිමේ පළමුවට පන්දුවට පහරදුන් පන්නිපිටිය ධර්මපාල කණ්ඩායම පන්දු වාර 41.4 ට ලකුණු 130ක් තුලදී සියලු දෙනාම දැවියන ලදී. පිළිතුරු ඉනිම ක්‍රීඩාකළ මාතර රාහුල විද්‍යාලයීය කණ්ඩායම පන්දු වාර 82.3 කදී සියලු දෙනාම දැවී ලකුණු 181 ක් ලබාගැනීමට සමත්විය.

දෙවෙනි ඉනිම ඇරඹූ පන්නිපිටිය ධර්මපාල කණ්ඩායම කඩුලු 5 ක් දැවී සිටියදී ලකුණු 144 ක් රැස්කර පන්දුවට පහර දීමේ අවස්ථාව රාහුල විද්‍යාලයීය කණ්ඩායමට ලබාදුනි. එහිදී රාහුල විද්‍යාලය කඩුලු 1 කට ලකුණු 21 ක් ලබා සිටියදී දිනය නිමාවී ජය පරාජයකින් තොරව තරගය නතරවිය

එක්දින තරගයේ ජය පන්නිපිටිය ධර්මපාල කණ්ඩායම හිමිකර ගන්නා ලද අතර එහි ආරාධිත අමුත්තා වශයෙන් ආචාර්ය සුජීව ලොකුහේවා මහතා සහභාගී විය.

**7 වෙනි පිටුවෙන්**

## හිටපු විදුහල්පති
## **එන් .ආරියවංශ මහතා** සමග

**ප්‍රශ්නය : පාසැලේ ක්‍රීඩා ක්ෂේත්‍රය ගැන ඔබ දකින්නේ කොහොමද ?**

පිළිතුර : දැන් ක්‍රීඩාව ගැන සෑහීමකට පත්වෙන්න ආමාරුයි . ක්‍රිකට් ගැන ඇහෙන්නෙත් නැති තරම්. මළල ක්‍රීඩාව දැන් එතරම් ප්‍රකට නැහැ. ජාතික තලයට අපේ දරුවෝ දක්ෂ ක්‍රීඩකයෝ ඉන්නවා. ඔවුන් හරි මගට මෙහෙයවන්න ඕන . යොමු කරන්න ඕන. ඒක ඉදිරියේදී දකින්න ලැබේවි කියලා විශ්වාස කරනවා. මගේ කාලේ මම ක්‍රීඩාවේ සිදුවුණු විශාල ජාවාරමක් පවා හෙළිකරගත්තා. මම ඒ ගැන දැන් කියන්න කැමති නැහැ. සමහර අවස්ථා මම මගේ අතටම අල්ලාගත්තා. ක්‍රීඩා සහතික පත්‍ර පවා ජාවාරම් කරපු හැටි. මම ඒවා නැවැත්තුවා. මම මේ කිව්වේ ඒ කාලේ වෙච්ච දෙයක්.

**ප්‍රශ්නය : ආදී සිසු ක්‍රියාකාරීත්වය ඔබ දකින්නේ කොහොමද ?**

පිළිතුර : ආදී සිසු සංගම් අවශ්‍යයි. නමුත් ඔවුන්ට පාසල පාලනය කරන්න දිය යුතු නැහැ කියන මතයේ මම ඉන්නවා. මේ කාලේ ආදී සිසුන් විද්‍යාලයේ දියුණුව වෙනුවෙන් ලොකු දායකත්වයක් දෙන බව අහන්න ලැබිලා තියනවා. පාසලට දරුවෝ දාගන්න විතරක් ආදී සිසු සංගම් වලට බැඳිලා වැඩක් නැහැ. පාසලට, වැඩක් කරන්නත් ඕන. පාසලේ භෞතික හා මානව සම්පත් වර්ධනයට විදුහල්පතිගේ කැමැත්ත මත ආදී සිසුන් ක්‍රියා කළ යුතුයි කියලයි මම කියන්නේ.

**ප්‍රශ්නය : විදුහලේ අනාගතය තවත් ජයගන්න නම් ඔබ සතු යෝජනා මොනවාද ?**

පිළිතුර : කාලීන වශයෙන් අප වෙනස් විය යුතුයි. අධ්‍යාපනය දේශපාලනයෙන් මිදුනොත් හොඳයි. ගුරුවරු පත්කරන්න, මාරු කරන්න, අයින් කරන්න දේශපාලන මැදිහත් කර ගත යුතු නැහැ.

අපට විද්‍යාලයීය ඉලක්ක එතකොට ජයගත හැකියි. සුදුසු දරුවට සුදුසු තැන ලැබිලා, විනය රැකගෙන ඉදිරියට යාම විද්‍යාලයේ නම රකින්න තියන හොඳම දේ විදියටයි මම දකින්නේ.

සංවාද සටහන : ශ්‍රීපාල් වන්නිආරච්චි

ඡායා : විසිත්ත රංගන

# රාහුලයෙන් තවත් චෙස් සූරයෙක්
## එමල් ඉමන්දිව් සමරසිංහ දිසානායක



අප විද්‍යාලයේ 4 වන වසරේ ඉගෙනුම ලබන එමල් ඉමන්දිව් සමරසිංහ දිසානායක සිසුවා මෙවර සමස්ථ ලංකා පාසල් ඒකල චෙස් තරගාවලියෙන් ප්‍රථම ස්ථානය ලබාගනිමින් විද්‍යාලයට කීර්තියක් ගෙන ආ සිසුවෙකි. තවද මෙම වසරේ ජූලි මස පැවැත්වෙන ආසියානු පාසල් ඒකල චෙස් තරගාවලියට සුදුසුකම් ලබා සහභාගී වනු ඇත.

2016 වසරේ අන්තර් පාසල් ඒකල චෙස් තරගාවලියේ දී දිවයිනේ 3 වන ස්ථානය ලබා එම වසරේ ඉරානයේ පැවති ආසියානු පාසැල් චෙස් තරගාවලියට සහ රුසියාවේ සෝචි නුවර පැවති සෝචි ලෝක පාසැල් ඒකල චෙස් තරගාවලියට පාසැල නියෝජනය කරමින් සහභාගී වූ සිසුවෙකි.

මෙවර ශ්‍රී ලංකාවේ පවත්වනු ලබන ආසියානු පාසල් චෙස් තරගාවලියට සහභාගී වී ජයග්‍රහණ ලබා අප පාසලට කීර්තියක් ලබා දීමට ඔහුට ශක්තිය හා ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරමු.

# වෙඩි තැබීමේ රිදී පදක්කම උමෙත් සඳමින් මහානාමට



ශ්‍රී ලංකා පාසල් ක්‍රීඩා වෙඩි තැබීමේ සංගමයේ සහ පෝලන්තයේ කැලිබර් ක්‍රීඩා වෙඩි තැබීමේ සංගමයේ අවබෝධතා පදනම මත 2018 මැයි මස 06 දින සිට 16 දින දක්වා පෝලන්තයේ බියාල්ස්ටොක් කැලිබර් වෙඩි පිටියේ පැවති වායු රයිෆල් සහ වායු පිස්තෝල වෙඩි තැබීමේ උසස් පුහුණු පාඨමාලාව සඳහා අධ්‍යාපන අමාත්‍යංශයේ අනුමැතිය ඇතිව ශ්‍රී ලංකාවෙන් සහභාගී වූ පාසල් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 11 දෙනා අතරට මාතර රාහුල විද්‍යාලය නියෝජනය කරමින් සහභාගීවූ එකම ක්‍රීඩකයා වූයේ දැනට අ. පො.ස. (උ. පෙ.) ගණිත අංශයේ ඉගෙනුම ලබන උමෙත් සඳමින් මහානාම සිසුවාය පුහුණු සැසිය අවසානයේ පැවති තරගාවලියේදී වායු රයිෆල් අංශයේ දෙවැනි තැන ලබා රිදී පදක්කම ලබා ගැනීමටද ද ඔහු සමත්විය . ශ්‍රී ලංකා පාසල් ජාතික සංචිතය ද නියෝජනය කරන උමෙත් සඳමින් මහානාම පුතණුවන්ට මාතර රාහුල විද්‍යාලයීය කොළඹ ආදී ශිෂ්‍ය සංගමය වෙනුවෙන් සුබ පතමු.

## 2018/2019 වසර සඳහා නියමිත වැඩසටහන් මාලාව

**2018 ජූනි මස 27** - වාර්ෂික ලේ දන්දීමේ වැඩසටහන
**2018 ජූනි මස 30** - රාහුල ආදී ශිෂ්‍ය ක්‍රීඩා සමාජය විසින් පවත්වනු ලබන සංගීත සන්ධ්‍යාව Rhythm of the night – Sing along with Annesley Malewana
**2018 ජූලි 21** - රාහුල ආදී ශිෂ්‍ය ක්‍රීඩා සමාජයේ මහා සභා රැස්වීම
**2018 සැප්තැම්බර් 22/23/24** - තෙදින චාරිකාව (21 දින රාත්‍රී 12 ට කොළඹින් පිටවීමට නියමිතයි )
**2018 දෙසැම්බර් 01** - රාහුල ආදී ශිෂ්‍ය ක්‍රීඩා සමාජය විසින් සංවිධානය කරනු ලබන වාර්ෂික සාමාජික දිනය
**2018 දෙසැම්බර් 29** - එක් දින චාරිකාව
**2019 මාර්තු 02** - රාහුල සැඳෑව
**2019 මාර්තු 30** - වාර්ෂික මහා සභා රැස්වීම

# කතු වැකිය

## අභියෝග හමුවේ නොසැලී විදුදය රකිනට පෙරට, තරුණ රාහුල ආදී සිසුවා.

රාහුලයට අවුරුදු අනූ පහක්. ඒ අනූ පස් වසර තුළ ඒ මනරම් විදු පියස කෙතරම් නම් නිර්මාණශීලී පුතුන් තනන්නට ඇත්ද? කෙතරම් නම් විද්වත් පුතුන් තනන්නට ඇත්ද? කෙතරම් නම් ක්‍රියාශීලී පුතුන් තනන්නට ඇත්ද? කෙතරම් නම් පිරිපුන් රහල් පුතුන් තනන්නට නම් ඇත්ද?

චිරං ජයතු රහල් මවුනි...

එතරන්ම ස්නේහයක්, සෙනෙහෙවන්තකමක්, දයාවක් දක්වූ ඒ විදුදයට පෙරලා යමක් කරනට ඒ සෑම සියලු පුතුනටම ගෞරවයෙන් ඇරයුම් කරමු.

යතිවරු පඬිවරු එක්ව සිතන්නෝ<br>
බොදු පිළිවෙත් යහගුණ සකසන්නෝ<br>
පැරැකුම් දෙමහල් මැදුරු තනන්නෝ<br>
බොදු පාසැල් ඉගැනුම සකසන්නෝ....

පෙරදා ගුණතිලක ප්‍රධාන ශාලාවේ, මර්සිලීන් හීන්කෙන්ද කලා ගුරුපියාණන් අතින් සිත්තම් වුණු සිතුවම් පෙළ මත දිගහැරුණු ඒ රාහුල යටගියාවේ කවි ඔබට අමතක නැතැයි සිතමු...

මා තර කළ මාතර පුරවර පවුරු ප්‍රාසාද නොමැති කාලයක විරාජමානව නැගී කුමාරගේ, ධර්මපාල, විජේවර්ධන ශාලා ඔබට තවමත් මතක ඇති...

රාහුල පාසැල් මවුන් වෙත මේ අනූ පස් වසර පුරාවටම ආ ගිය, එන යන ඔබ මා අප හැම දෙස නොසැලී බලා හුන් සරම්මුදලි වලව්ව ඔබට හොඳටම මතක ඇති...

සංගීත කාමර, නැටුම් කාමර, විද්‍යාගාර, පන්ති -කාමර, පන්සල් බිම, පිට්ටනිය ආදී එකී මෙකී නොකී සෑම තැන්වල ඔබ එදා මහත් කෙළිදෙලෙන් ගතකරන්නට ඇති, ඒ බැව් ඔබට මතක ඇති...

ඔබට මතක ඇති, බැට් එක වෙනුවට කැඩිච්ච ඩෙස්ක් එකක ලී කෑල්ලකින් ක්‍රිකට් ගහපු හැටි...

ඒ සොඳුරු අතීතය යළිදු ස්මරණය කරනු රිසි වූයේ අද වන විට අප පාසැලත්, එහි ආදී සිසුන් වන අපත් අතර ඇති සබැඳියාව, ළබැඳියාව ක්‍රමයෙන් දුරස්වන බව දැනුණු නිසාවෙනි. එයට මෙයයයි කියන්නට විශේෂ හේතුවක් නොමැති වුවත් එය එසේ සිදුවන බව නම් නොරහසක්. ආසන්නතම වශයෙන් හේතුවක් දක්වන්නේ නම්, අද දින පාසලෙන් නික්මයන තරුණ ආදී සිසුවා හමුවේ ඇති අභියෝගයන් දැක්විය හැකියි.. ඉමක් කොනක් නොපෙනන ලෝකයේ ඇති අභියෝගයන් වන, විශ්ව විද්‍යාල උසස් අධ්‍යාපනය, රැකියා තරගය, නිවාස, විවාහ, යාන වාහන... මේ ආදී අති මහත් වූ අභියෝග රැසකට මුහුණ දෙන තරුණයා පාසලෙන් දුරස්වීම අරුමයක් නොවේ.

කරුණු කාරණා කෙසේ යෙදුනත් පාසලෙන් නික්මයන ආදී සිසුවා තරුණ ජවයෙන් පිරිපුන් බවනම් නොරහසකි. එබැවින් ඒ තරුණ ජවය රහල් මාතාවගේ ප්‍රගමනය පිණිස රහල් මාතාව සමීපයේ සිටීම පෙරදාටත් වඩා අද දින අත්‍යවශ්‍ය කරුණක්ව ඇති බැව් හැඟේ. එසේ නොවන්නට ඒ මනරම් විදුපියස විගස වියපත්වනු ඇත.

**රාහුල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය - කොළඹ ශාඛාව**

**CME/001/08/NPO**

STAMP

**ආපසු ලිපිනය**<br>
ගරු ලේකම්,<br>
ඩී පී වික්‍රමසිංහ,<br>
අංක 100/19, වැලිකඩවත්ත පාර,<br>
රාජගිරිය.

රාහුල RAHULA<br>
සිවු මාසිකය - 2018 අප්‍රේල් - 2018 ජූලි

**රාහුල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය - කොළඹ ශාඛාවේ නිල ප්‍රකාශනය**

**සංස්කරණය** - විසිත්ත රංගන **ග්‍රැෆික් සැකසුම** - අනුජ කාමන් වික්‍රමසිංහ **මුද්‍රණය** - ජයන්ත ඩයස් (සුපර්ග්‍රැෆික්ස්)